# පොරොන්දුව - විශ්වාසය

## කෙටිකතාව



**සැ**න්දෑ වළා අතරින් රත් පැහැ ඉර එළිය නිවසේ පැල දොරින් ගෙට ඇතුළු වී රාත්‍රිය ළඟ ළඟම බව කිය යි. මැටි බිත්ති සහිත පුංචි ගෙදර සාලය මැද පැදුරක් එලා මල්ලිලා දෙන්නාත් සමඟ මම පාසලේ දී දුන් ගෙදර වැඩ කරමින් සිටියෙමි.

තේ දළු කඩා නිවසට ආ අම්මා දොළට ගොස් ඇඟපත සෝදාගෙන විත් රෑ කෑමට සාදන්නට ගොටුකොළ සුද්ද කරයි.

"අම්මේ....., තාත්තා උදේ ද ගියේ?" ලොකු මල්ලි ඇසුවේ ය.

"හ්ම්....." අම්මා පිළිතුරු දුන්නා ය.

"අද රබර් අරගෙන ගියා ද?" මා ඒ ප්‍රශ්නය ඇසුවේ තාත්තා ප්‍රමාද වී පැමිණීමට හේතුව අනුමාන කිරීම උදෙසා ය.

"ඔව්..... පොළටත් ගිහින් එයි." අම්මා කීය.

ගෙයි පිටුපස උළුවස්ස උඩ හිඳ ගොටුකොළ සාදමින් අම්මා විටින් විට පාර දෙස බලයි.

"අම්මේ..... තාත්තා අදත් බීලා ඇවිත් රණ්ඩු වෙයි ද?" චූටි මල්ලි බියමුසුව විමසී ය.

"මං දන්නෙ නෑ දරුවො." කියමින් අම්මා කුස්සියට ගියා ය. චූටි මල්ලි පමණක් නොව වචනයෙන් නොකීව ද මා මෙන්ම ලොකු මල්ලී ද සිතින් ඒ ගැන සිතමින් උන් බව මා හොඳින් දනී.

"මේ..... ඔයා කියව කියව ඉන්නේ නැතුව ඉක්මනට වැඩ ටික ඉවර කරගන්න. තාත්තා බීලා ආවොත් වැඩ කරන්න වෙන්නෙ නෑ නේ." චූටි මල්ලීට ඒ අවවාදය ලොකු මල්ලීගෙනි. සැබවින් ම මා ද හැකි ඉක්මනින් පාසලේ දී විද්‍යා විෂයට අදාළ ව කරගෙන යාමට තිබූ හෘදයේ රූප සටහනක් ඇඳ එහි කොටස් නම් කරමින් උන්නේ හෙට දිනයේ ඒ කරගෙන යාමට තිබූ නිසා ය.

මම යමක් තේරුම්ගන්නා අවධියේ සිට ම පුරුදු බීමත් තාත්තාගේ ස්වභාවය හා නොබී ඉන්නා තාත්තාගේ ස්වභාවය දැනගෙන සිටියෙමි. නොබී හොඳ සිහියෙන් ඉන්නා මගේ තාත්තා නිහඬ ය. සැර පරුෂ පාටක් ද පෙනෙන්නට නැත. වැඩි කතාවකින් තොර වුව ද අප තිදෙනා කෙරෙහි හා අම්මා කෙරෙහි දැඩි ආදරයක් දක්වන්නේ ය. නමුදු ඊට හාත්පසින් ම වෙනස් බීමත් තාත්තා අසල්වැසියන් පවා සතුරන් කරගනී. පරුෂ වචන සැර පරුෂ විලාසය අප තිදෙනා පුංචි කාලයේ මුල්ලකට ඇද දමන තරම් ය.

"අම්මේ..... පහළ කවුද හූ කියනවා ඇහෙනවා වගේ....." තාත්තා නිවසට එන තෙක් විමසිල්ලෙන් සිටි ලොකු මල්ලි ඒ හඬ හැඳින එසේ කීය. අම්මා බර හුස්මක් ගෙන පහළ දමා එය නොඇසුණාක් මෙන් කුස්සියේ සිට තම කාර්යයේ නියුක්ත වූයේ නොසන්සුන් සිත් ඇතිව මෙන් ම දැඩි කලකිරීමෙන් බව මම හොඳින් දනිමි.

"අක්කේ පොත් ටික අරන් තියමු ද?" ඒ පැනය චූටි මල්ලීගෙනි.

''හ්ම්..... ලොකු..... ඔයා වැඩේ ඉවර ද?'' මා එසේ අසන විටත් ලොකු මල්ලි ඉක්මනින් ඉක්මනින් චිත්‍රයක් පාට කරමින් උන්නේ ය.

''තව චුට්ටක් තියෙනවා..... ඔය දෙන්නා පොත් අරන් තියන්නකෝ.'' චූටි මල්ලි සහ මම පොත් ටික රැගෙන ගොස් පොත් තැබීමට තාත්තා විසින් සාදා දුන් කුඩා පොත් මේසය මත පොත් ටික තැබුවෙමු. ලොකු මල්ලී ද හැකි ඉක්මනට වැඩ ඉවරකොට පොත් ටික පොත් මේසය මත තබා පැදුර හකුළා තැබීය.

''අක්කේ..... මට බයයි. තාත්තා අදත් රණ්ඩු වෙයි ද?'' මැටි ගෙයි කුඩා කාමරය තුළ මුල්ලක වාඩි වී උන් චූටි මල්ලී විමසූ පැනයට මා දිය යුතු පිළිතුර කුමක් ද? එසේ නොවන්නේ යැයි පවසා ඔහු අස්වසාලිය නොහැක. මන් ද තව සුළු මොහොතකින් අප ඉදිරිපිට ම එය අසත්‍යයක් වනු ඇත. මට පිළිතුරක් නොවී ය. නිහඬව උන් මා සිත තාත්තා ගැන සිතන්නට විය.

පාසල් යාමට අවශ්‍ය සෑම දෙයක්ම අප තිදෙනාට නොඅඩුව ලබා දෙන තාත්තා හොඳින් ඉගෙන ගන්න යැයි හොඳ සිහියෙන් සිටිනා විට පවසයි. එයට උනන්දු කරවයි. නොබී සිටින තාත්තා හැම මොහොතක ම අප වෙනුවෙන් ම වෙහෙසෙයි. කුඹුරු වැඩ, තේ ඉඩමේ වැඩ, රබර් කිරි කැපීම, බුලත් පාත්තියේ වැඩ ආදී බොහෝ වැඩවල යෙදෙයි. අම්මා ද තාත්තා ට හැම වැඩකට ම උදව්වට හිඳියි. තාත්තා මහන්සියෙන් උපයන සල්ලි බීමට වියදම් කිරීමෙන් බීමත් තාත්තා; අපට ලබා දෙන සතුට මොහොතකින් දුකක් බවට පෙරළෙයි. මෙතෙක් කාලයක් සතුට වෙනුවෙන් හිනාවුණ වාරවලට වඩා වැඩියෙන් තාත්තාගේ බීමත්කම නිසා හෙළූ කඳුළු වැඩි ය.

''ආනෙ ඩිංගක් ඉන්නකෝ.....

ඔය

දෑත පොඩ්ඩක් දෙන්නකෝ.....

හූ..........

හූ..... හූ.....''

බීමත් තාත්තාගේ හඬ නිවස අසලම ඇසුණි.

''අක්කේ.'' චූටි මල්ලි මගේ අතේ එල්ලුණි. ලොකු මල්ලි වෙන්නෙ කුමක් ද යන්න දන්නා නිසා ම ඔහේ බලා උන්නේ ය. අම්මා ද බියමුසු කලකිරීමක් රැඳි වතින් උළුවස්සට පිට දී උන්නා ය.

තාත්තා ගෙනා බඩුමල්ල මිදුලේ අතහරින හඬ ඇසිණ.

''මේ ටික ගනින්..... මෙච්චර දුර කර තියන් ඇවිල්ලා ගේ අස්සට දාන්නත් ඕනෙ ද.....?''

අම්මා කුප්පි ලාම්පුව ද රැගෙන මිදුලට යනවාත් සමග අපි තිදෙනා ද හෙමින් හෙමින් උළුවස්ස ළඟට වන්නට වීමු. අම්මා මිදුල පුරා විසිරුණු අල ඇනු අහුලමින් උන්නා ය. කෙළින් සිටගැනීමටවත් බැරි තරමට බීමත්ව දෙපැත්තට වැනෙමින් අම්මාට බැන වදින තාත්තා ලාම්පු එළියෙන් පෙනෙන්නට විය.

අම්මා රැස් කරගත් අල ඇනු ටික රැගෙන ගෙට ආවේ ඉතිරි එළවළු ටික රැස් කිරීමට එළවළු වට්ටිය ගෙන යාමට ය.

''මේ ටික කාට ද ගෑනියේ?''

තාත්තාගේ සැරපරුෂ හඬත් සමඟ අප තිදෙනාම බියේ වෙව්ලන්නට විය. අම්මා කිසිවක් නොකියා එළවළු ටික රැස් කරගෙන කුප්පි ලාම්පුව ද රැගෙන ගෙට ඇතුළු වී තාත්තාට රෑ කෑමට බෙදා තිබූ බත් පිඟානට හොදි බෙදන්නට විය. අපේ ඉඟදර හැමට ම කලින් තාත්තාට බත් බෙදීම අම්මාගේ සිරිත විය.

විසිවෙමින් ගෙට ඇතුළු වූ තාත්තා මොනවදෝ කියමින් බිම ඉඳ ගත්තේ ය.

''බත් බෙදුවා..... බත් කන්න.....'' යි බය රැඳි මුවඟින් පැවසූ අම්මා වතුර වීදුරුවක් තාත්තා වෙත පිළිගැන්වීය. නොසිතූ ආකාරයට වතුර වීදුරුව ගත් තාත්තා ආපිට අම්මාගේ දෙපා ළඟ වතුර වීදුරුව බින්දේ ය.

''මට බත් එක දීපන්..... වතුර..... වතුර මං අරගෙන බොන්නම්. බත් එක දීපන්.''

අම්මා බත් පිඟාන දෑතින් ම දී පසුව අතින්ම වීදුරු කටු ඉවත් කරන්නට විය. නොබී සිහිකල්පනාවෙන් සිටින වෙලාවට තාත්තා පුටුවක් මත හිඳ අම්මා ළඟට ගෙනත් දෙන බත්පත පිළිවෙළට කන ආකාරයත් බීමතින් බිම වාඩි වී බත් කන තාත්තා පිළිබඳවත් සිතන විට පුදුම සහගත ය. මත්වතුරට මිනිසෙකුව මෙතරම් ම වෙනස් කළ හැකි ද?

එතනින් ඉවත් වූ මා මෙවන් තවත් දවස් මගේ ජීවිතය තුළ කෙතරම් නම් ඇත් ද යන්න හිතමින් ඉස්තෝප්පුවේ බිම ඉඳ ගත්තේ වෙන කළ හැකි කිසිවක් නොතිබුණු නිසාවෙනි. අපේ සතුට හොයන තාත්තා මේ තරමට ම දුකක් අපට

දෙන්නේ මොන හිතකින්දැයි නොදනිමි.

''අනේ එපා තාත්තේ.....''

මල්ලිලාගේ හැඬීමත් සමඟ යළි මා කුස්සිය දෙසට දිව ගියේ ය. අම්මාට පහර දෙන්නට සැරසෙන තාත්තා පිළිබඳව එවිට දැනුනේ පිළිකුලකි. හැකි වෙර දමා අපි තිදෙනා අම්මාට පහර දීම වැලැක්වීමට වෙහෙසුණෙමු. හඬමින්, ''අනේ එපා තාත්තේ.'' යැයි කෑ ගහන අපි තිදෙනා ගැන කිසිඳු අනුකම්පාවක් නැති තාත්තා යක්ෂාවේශයෙන් අම්මාට පහර දෙන ආකාරය දකින්නට තරම් අපි පව් කර ඇත්තෙමු.

රෑ මැදියමක් වන තුරුම අම්මාට, අසල්වැසියන්ට බැණ අඬ ගැසූ තාත්තා නින්දට වැටුණි. රෑ කෑමක් නොලද අම්මා සහ අපි තිදෙන හිතේ පිරී දුක කලකිරීම තුරුල් කරගෙන ම නිදි පැදුරට වැටුණි. එළි වනතෙක් හරි හැටි නින්දක් නොලද මා, අම්මා කළුවරේ ම හෙමි හෙමින් ඉකිබිඳින හඬ අතර තනි වී නිහඬවම උන්නේ මා අවදියෙන් බව දනිතොත් අම්මා තවත් හඬනා බව දන්නා නිසාම ය.

නොදැනීම පැය කීපයක නින්දක් ලද මා පසුදින අවදි වූයේ පාසල් යන්නට ය. මල්ලිලා ද අවදි කර පාසල් යාමට සූදානම් වූයේ පාසලේ ගත කරන පැය කීපය තුළ හිතට දැනෙන සතුට නිසාම ය. අම්මා මා අවදිවන විට හොද්දක් සමඟ බත් උයා තිබුණි. තාත්තා තව ම නින්දේ ය.

රාත්‍රී ආහාරයක් නොලද අපි උදේ ආහාරය ගැනීමට මැලි නොවූයේ කුසගින්න දැනුණු නිසාම ය. තාත්තා රාත්‍රියේ විසි කරන ලද වළං මිදුල පුරා විය. බත් හොදි සියල්ල විසි කර තිබූ අතර අම්මා ඒවා අස්කර මිදුල පිරිසිදු කළේ කිසිවෙක් නිවෙසට පැමිණියහොත් දැකීම නුසුදුසු බව වටහාගෙන සිටි නිසා ය. කොපමණ පහර කෑව ද අම්මා කිසිවෙකුට තාත්තා ගැන නුගුණ කියා නැත. ඒ මගේ අම්මා තාත්තා වෙත දැක්වූ ආදරය නිසාම බව මම හඳුනාගෙන සිටිමි. එවන් බිරිඳක් වූ මගේ අම්මා උතුම් මාතෘත්වයකින් ද පොහොසත්ව සිටින්නා ය. නමුදු මෙලෙස දුක් විඳීමට තුරම් මගේ අම්මාට සිදුව ඇත්තේ තාත්තාගේ බීමත්කම නිසා ම ය.

''අක්කේ..... හරි.''

ලොකු මල්ලි සූදානම් වී අවසන මට අඬගැසුවේ ය. තාත්තා නිදා සිටි තැනට ගිය අපි තාත්තා අවදි කරවීමු. තාත්තා අවදිව අම්මා ගෙනා වතුර වීදුරුවෙන් කට සෝදා වතුර බී අප තිදෙනා දෙස බැලී ය. නිදිවරා, අඬා ඉදිමුණු දෑස් සහිත අප ගැන හිතේ රැඳුණු දුක තාත්තාගේ මුහුණේ විය. අපි දණ ගසා තාත්තාට ද අම්මාට ද වැන්දෙමු. තාත්තා අප තිදෙනාගේම හිස අත ගෑවේ සැබෑ ආදරයෙන් නොවන බව කිසිසේත් ම කිව නොහැක. ඒ ආශිර්වාදය සත්‍යයක් බව මා හොඳින් දන්නේ ය. චූටි මල්ලි තුරුලු කරගත් තාත්තා, ''අනේ මං ආපහු ඔයාලට දුකක් දෙන්න බොන්නෙ නෑ පුතේ.....'' යැයි කීවේ සැබෑ කලකිරීමෙන් බව මම විශ්වාස කළෙමි.

''අනේ බොන්න එපා තාත්තේ. අපි බයයි තාත්තා බීලා ගෙදර එනකොට.....''

චූටි මල්ලිගේ හඬ හැඬුම් එන්නට ආසන්නව ඇසුණි. බර හුස්මක් ගත් තාත්තා, ''හ්ම්..... දැන් යන්න පුතේ. ඔයාලට පරක්කු වෙනවා.....'' කී තාත්තා අපිව පිටත් කර නොපෙනෙන දුරට යන තෙක් අප දෙස බලා සිටි බව ආපසු හැරී බැලූ මම දුටුවෙමි. මට ඇති වූයේ අනුකම්පාවකි.

මෙවැනි බොහෝ රාත්‍රියන් පහන් වූ උදෑසනක තාත්තා පවසන සුපුරුදු වදන් එසේ විය. නමුත් පොරොන්දු වූ උදෑසනක් ගෙවී සවසක ඒ පොරොන්දුව තාත්තා කඩ කළේ මත්වතුර රහ නිසා අපිව මොහොතකට හෝ අමතකව ගිය නිසාදැ'යි සිතේ.

නමුදු එසේ කියූ හැම උදෑසනකම මෙන් අදත් මම තාත්තා විශ්වාස කරමි.

පාසල් ඇරී නිවසට ගිය එදින ද තාත්තා නිවසේ නොසිටියේ ය.

සවස; නිහඬ අපේ පුංචි මැටි ගෙදරට ඇසෙන දුරින්, ටිකෙන් ටික ළං ළංව ඇසෙන,

''ආනෙ ඩිංගක් ඉන්නකෝ.....

ඔය.....

දෑත පොඩ්ඩක් දෙන්නකෝ.....

හූ..........

හූ..... හූ.....'' හඬ ඇසෙන්නට විය.

**එල්. ඒ. වයි. හර්ෂණී**